වාර්ගිකත්වය අදාළ ද? අවශ්‍ය ද?
සංචාරක වීසා මත මැලේසියාවට ගොස් රැකියාවක් සොයා ගැනීමේ බලාපොරොත්තුවෙන් සිටි ශ්‍රී ලාංකීය කාන්තාවක්, ගොඩනැගිල්ලකින් ඇද වැටී මිය යෑමේ සිදුවීම මාධ්‍ය අවධානයට යොමු වී තිබිණි
.
මෙම මියගිය කාන්තාව එහිදී බාර ගත් බවට පැවසෙන නීති විරෝධී රැකියා ඒජන්සිය පවත්වාගෙන යන තැනැත්තිය පිළිබඳව, මැයි 26, 2033 දින සිංහල භාෂා පුවත්පත් කිහිපයක වාර්තා වී තිබූ ආකාරය මෙසේය.
* අද, ලංකාදීප, දිනමිණ - "ද්‍රවිඩ කාන්තාවක්"
* අරුණ - වාර්ගිකත්වයක් දක්වා නැත.
1) මෙම නීති විරෝධී ඒජන්සියක් පවත්වාගෙන ගිය බව කියන කාන්තාවගේ වාර්ගිකත්වය "ද්‍රවිඩ" යනුවෙන් ඉස්මතු කර දැක්වීම පුවතට අදාළ ද?
2) අද, ලංකාදීප සහ දිනමිණ පුවත් මගින්, පුවතට අදාළ නොවන වාර්ගිකත්වය ඉස්මතු කොට නොදැක්වීමේ මාධ්‍ය ආචාර ධර්මය කඩ කර නොමැති ද?
(මෙම පුවත එදින දමිළ භාෂා පුවත්පත් වලින්, Tamil Mirror පුවත්පතෙහි පමණක් වාර්තා වී තිබුණත්, එම පුවත තුළ ද වාර්ගිකත්වය සම්බන්ධයෙන් සඳහන් කර නොතිබුණි.)
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

# අදාළ නොවන වාර්ගිකත්වය ඉස්මතු නොකරමු!

**අද**

මැලේසියාවේ රැකියාවකට ගිය
**කාන්තාවක් ගොඩනැගිල්ලකින්
ඇද වැටී මරුට**

ශ්‍රී ලංකාවේ සහ
මැලේසියාවේ ද්විත්ව පුරවැසිභාවය හිමි
ද්‍රවිඩ කාන්තාවක් විසින් එරට නීති විරෝධී
ආකාරයට පවත්වාගෙන යන රැකියා

**ද්‍රවිඩ කාන්තාවක්**

**ලංකාදීප**

**මැලේසියා රැකියාවකට
ගිය මෙරට එක්දරු මවක්
උඩුමහලකින් වැටී මරුට**

ශ්‍රී ලංකාවේ සහ මැලේසියාවේ ද්විත්ව
පුරවැසිභාවය හිමි ද්‍රවිඩ කාන්තාවක විසින්
එරට නීති විරෝධී ආකාරයට පවත්වාගෙන
යන රැකියා ඒජන්සියකට මෙම කාන්...

**ද්‍රවිඩ කාන්තාවක**

**දිනමිණ**

**කුරුණෑගල කාන්තාවක්
මැලේසියාවේ ගොඩනැගිල්ලකින්
ඇද වැටී මරුට**

ශ්‍රී ලංකාවේ සහ මැලේසියාවේ
ද්විත්ව පුරවැසිභාවය හිමි ද්‍රවිඩ
කාන්තාවක විසින් එරට නීති විරෝධී
ආකාරයට පවත්වාගෙන යන රැකියා

**ද්‍රවිඩ කාන්තාවක**

## අදාළ නොවන වාර්ගිකත්වය වාර්තාකර නැත

**සංචාරක වීසා වලින්
මැලේසියා ගිය කත
මහල් ගොඩනැගිල්ලකින්
ඇද වැටී මරු දකී**

**අරුණ**

ශ්‍රී ලංකාවේ සහ මැලේසියාවේ
ද්විත්ව පුරවැසිභාවය හිමි
කාන්තාවක විසින් එරටදී නීති
විරෝධී ලෙස පවත්වාගෙන යන
රැකියා ඒජන්සියකට මෙම කාන්තාව
බාරදී ඇති අතර,

මැයි 26, 2023 දින, සිංහල භාෂා පුවත්පත් දත්ත ඇසුරිණි.

ETHICS EYE
පිටු මායිමෙන් ඔබ්බට